**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025 සඳහා පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

| කෘෂි විද්‍යාව I | 08 | S | I | පැය දෙකයි |
|---|---|---|---|---|

**උපදෙස් :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5), යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන**,** එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

1. හරිත විප්ලවය හේතුවෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට ඇති වූ බලපෑමක් වන්නේ,
   (1) නව ප්‍රභේද භාවිතය නිසා ජෛව විවිධත්වය ඉහළ යාම ය.
   (2) නිෂ්පාදන පිරිවැය අවමවීම නිසා ආර්ථික ලාභය වැඩිවීම ය.
   (3) පරිසර හිතකාමී සහ සෞඛ්‍යාරක්ෂිත යෙදවුම් භාවිතය පිළිබඳව වැඩි අවධානයක් යොමු වීම ය.
   (4) නව ප්‍රභේද භාවිතය තුළින් ඒකක ක්ෂේත්‍රඵලයකින් ලැබෙන අස්වනු ප්‍රමාණය ඉහළ නැංවීම ය.
   (5) පාරම්පරික කෘෂිකර්මාන්තය වර්ධනය වීම නිසා රටේ ආහාර සුරක්ෂිතතාව වැඩි දියුණු වීම ය.

2. රූපයේ දැක්වෙන බීජ ප්‍රරෝහණ ආකාරය පිළිබඳ වඩාත් නිවැරදි වගන්තිය තෝරා දක්වන්න.



   (1) බීජාංකුරය පමණක් පොළොවෙන් මතුපිටට වර්ධනය වේ.
   (2) බොහෝ බීජ වර්ගවල බීජ පත්‍ර ප්‍රභාසංස්ලේෂණය නොකරයි.
   (3) බීජාධරය වේගයෙන් වර්ධනය වී බීජ පත්‍ර පොළවෙන් ඉහළට ඔසවයි.
   (4) අඹ සහ කඩල මෙම බීජ ප්‍රරෝහණ ආකාරය පෙන්නුම් කරයි.
   (5) සියලුම ද්විබීජ පත්‍රී බීජ මෙම බීජ ප්‍රරෝහණ ආකාරය පෙන්වයි.

3. එක්තරා පසක දෘශ්‍ය ඝනත්වය 1.2 $g/cm^3$ ක් වන අතර එහි සත්‍ය ඝනත්වය 2.65 $g/cm^3$ ක් වේ. එම පසෙහි සවිවරතාව,
   (1) 47 % ක් වේ.
   (2) 49 % ක් වේ.
   (3) 55 % ක් වේ.
   (4) 63 %ක් වේ.
   (5) 72% ක් වේ.

4. අතු කැබලි සිටුවීමට සැකසීමේ දී එහි පහළ කෙළවර ආනතව කපා ගැනීමට හේතු වන්නේ,
   (1) දඬු කැබැල්ලේ එන්සයිම ක්‍රියාකාරිත්වය වැඩි කර ගැනීමට ය.
   (2) දඬු කැබැල්ලේ හෝමෝන ක්‍රියාකාරිත්වය වැඩි කර ගැනීමට ය.
   (3) එක් දඬු කැබැල්ලකින් කපා ගත හැකි දඬු කැබලි ප්‍රමාණය වැඩි කර ගැනීමට ය.
   (4) දඬු කැබැල්ලේ වාෂ්පීකරණ පෘෂ්ඨය අඩු කර වියළී යාම අවම කිරීමට ය.
   (5) දඬු කැබැල්ලේ මුල් ඇදෙන ක්ෂේත්‍රඵලය වැඩි කර ගැනීමට ය.

5. ආහාර ඇසුරුම් ලේබල් කිරීමේ දී ,
   (1) නිෂ්පාදනයේ පොදු නාමය හා සන්නාම නාමය පමණක් අඩංගු වීම ප්‍රමාණවත් වේ.
   (2) පොදුනාමයේ අකුරුවල ප්‍රමාණය, සන්නාම නාමයේ අකුරුවල ප්‍රමාණය මෙන් තුන් ගුණයක් වේ.
   (3) කල් ඉකුත් වීමේ දිනය, භාෂා තුනෙන්ම දැක්විය යුතු අතර එහි වර්ෂය ඉලක්කම් 4 කින් දැක්විය යුතු වේ.
   (4) ආහාරයක පෝෂණීය අන්තර්ගතය සෑම ලේබලයකම සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ.
   (5) ප්‍රවිකිරණයට ලක් කළ ආහාරවලට, එයට අදාළ ජාත්‍යන්තර සංකේතය පොදුනාමයට ආසන්නව දැක්විය යුතු වේ.

[දෙවැනි පිටුව බලන්න]

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

6. 1978 හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්ති නිසා ආර්ථිකයේ සිදු වූ වෙනස්කමක් වන්නේ,
   (1) විදේශ වෙළඳාම් ප්‍රමාණය අඩුවීම ය.
   (2) විදේශ ආයෝජන ප්‍රමාණය වැඩිවීම
   (3) පෞද්ගලික කර්මාන්ත ජනසතු කිරීම ය.
   (4) කාර්මික නිෂ්පාදන ධාරිතාව අඩුවීම ය.
   (5) කෘෂිකාර්මික භාණ්ඩ සඳහා විදේශීය වෙළඳපොළට ප්‍රවේශ වීමේ අවස්ථා අවම වීම ය.

7. බිම් සැකසීම පිළිබඳ පහත සඳහන් වගන්ති සලකන්න.
   A - බෑවුම් භූමිවල පාංශු ඛාදනය ශුන්‍ය බිම් සැකසීම මගින් අවම කළ හැකි ය.
   B - අවම බිම් සැකසූ භූමියක බීජ වැපිරීම අපහසු මෙන්ම බීජ ප්‍රරෝහණය ද අඩු ය.
   C - ශුන්‍ය බිම් සැකසීමේ දී ප්‍රාථමික බිම් සැකසීම ක්ෂේත්‍රය පුරා ම සිදු කර, ද්විතියික බිම් සැකසීම පැළ සිටුවන පේළිය තුළ පමණක් සිදු කෙරේ.

   ඉහත වගන්ති අතුරෙන්,
   (1) A පමණක් නිවැරදි ය.
   (2) B පමණක් නිවැරදි ය.
   (3) C පමණක් නිවැරදි ය.
   (4) A හා B පමණක් නිවැරදි ය.
   (5) B හා C පමණක් නිවැරදි ය.

8. බෝග ක්ෂේත්‍රවල පරාග කාරකයින් ආරක්ෂා කර ගැනීම සඳහා උපකාරීවන ක්‍රමෝපායන් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   A - පරාගකාරකයින් ආකර්ෂණය වන ශාක වගා කිරීම
   B - පලිබෝධනාශක භාවිතය අවම කිරීම
   C - පරාගකාරකයින්ට හිතකර වාසස්ථාන සැපයීම

   ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ
   (1) A පමණි.
   (2) B පමණි.
   (3) A හා B පමණි.
   (4) A හා C පමණි.
   (5) A, B හා C යන සියල්ලම ය.

9. ශිෂ්‍යයෙක් වී බීජ තොගයකින් බීජ 100 බැගින් වූ සාම්පල තුනක් අහඹු ලෙස ගෙන, ඒවා ජලයේ පෙඟවීමෙන් පසු ප්‍රරෝහණය වීමට පෙට්‍රි දීසි තුළ තැන්පත් කළේය. සතියකට පසු එම නියැදි පරීක්ෂා කළ විට බීජ 86, 93 හා 70 බැගින් ප්‍රරෝහණය වී තිබුණි. එම වී නියැදියේ ප්‍රරෝහණ ප්‍රතිශතය වන්නේ,
   (1) 75% කි.
   (2) 83% කි.
   (3) 89% කි.
   (4) 92% කි.
   (5) 93% කි.

10. ආහාර සරු කිරීම (Enrichment) යනුවෙන් හඳුන්වන්නේ
   (1) ආහාර සැකසීමේදී එයට පරිරක්ෂක ද්‍රව්‍ය එකතු කිරීමයි.
   (2) ආහාරයේ පෙර නොතිබූ පෝෂක එකතු කිරීම මගින් ආහාරයක පෝෂණ ගුණය වැඩි කිරීම යි.
   (3) ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ දී විනාශ වූ පෝෂක නැවත එකතු කිරීම යි.
   (4) ක්ෂුද්‍ර ජීවීන් යොදා ගෙන ආහාර පැසවීමට භාජනය කිරීම යි.
   (5) එකම අමුද්‍රව්‍යයක් යොදා ගෙන විවිධ රසැති නිෂ්පාදන බිහි කිරීම යි.

11. පිපෙට්ටු ක්‍රමය මගින් පාංශු වයනය සෙවීමේ පරීක්ෂණයක දී පස් සාම්පලයට හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් එකතු කිරීමේ අරමුණ වන්නේ,
   (1) පසේ ඇති ඛනිජ අංශු වෙන්කර ගැනීමයි.
   (2) පසේ ඇති කාබනික ද්‍රව්‍ය ඉවත් කර ගැනීමයි.
   (3) පස තුළ සිදුවන රසායනික ප්‍රතික්‍රියා පහසු කිරීමයි.
   (4) පස් අංශු අවසාදනය වේගවත් කිරීමයි.
   (5) පස් අංශු අතර සච්ඡිද්‍රතාව ඇති කිරීමයි.

[තුන්වැනි පිටුව බලන්න]

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

12. ගොවි මහතෙක් ඔහුගේ ජලරෝපිත වගා ක්‍රමය යටතේ වගා කරන ලද බෝගයක අස්වනු ක්‍රමයෙන් අඩුවන බව නිරීක්ෂණය කළේය. එහි පෝෂක ද්‍රාවණය පරීක්ෂා කළ කෘෂි උපදේශකවරයා මෘදු අම්ලයක් යෙදීමෙන් හා පිරිසිදු ජලය යෙදීමෙන් පෝෂක මාධ්‍යයේ ඇති ගැටලු නිවැරදි කළ හැකි බව ප්‍රකාශ කළේය. එම ගැටලුව විය හැක්කේ පිළිවෙලින් පෝෂක මාධ්‍යයේ,
   (1) ඔක්සිජන් සාන්ද්‍රණය අඩු වීම හා නිර්වායු ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය අධික වීම ය.
   (2) Ca සහ Mg වැනි භාෂ්මික අයන අඩු වීම හා බැර ලෝහ අයන සාන්ද්‍රණය අධික වීම ය.
   (3) pH අගය අඩු වීම හා විද්‍යුත් සන්නායකතා අගය වැඩි වීම ය.
   (4) pH අගය වැඩි වීම හා විද්‍යුත් සන්නායකතා අගය වැඩි වීම ය.
   (5) pH අගය වැඩි වීම හා විද්‍යුත් සන්නායකතා අගය අඩු වීම ය.

13. ශාකවල මනා පැවැත්ම සඳහා වැදගත්වන ශාක පෝෂක පිළිබඳ නිවැරදි වගන්තිය වන්නේ,
   (1) ශාකයක වියළි බරින් 0.1% ට වඩා වැඩියෙන් අවශ්‍ය වන, පසෙන් ලබාගත හැකි සියලු පෝෂක, මහා පෝෂක වේ.
   (2) ශාකයකට චල පෝෂක, ඌනතාවක් ඇති වූ විටකදී ඌනතා ලක්ෂණ පළමුව ශාකයේ පරිණත පත්‍රවල දක්නට ලැබේ.
   (3) Ca, S සහ Zn යන පෝෂක ප්ලෝයම පටක හරහා පරිණත පටකවල සිට වර්ධනය වන පටක කරා ගමන් ගන්නා මූලද්‍රව්‍ය වේ.
   (4) Na, Al සහ Mo යන පෝෂක ශාකයේ නිරෝගී වර්ධනයට හා පැවැත්මට අත්‍යවශ්‍ය වේ.
   (5) 'උපකාරක මූලද්‍රව්‍ය, ඒවා අවශෝෂණය කරන ප්‍රමාණය හා අවශෝෂණය කරන මාධ්‍ය අනුව වර්ග කෙරේ.

14. ගොවි මහතෙක් තම වගාව සඳහා නිරෝගී රෝපණ ද්‍රව්‍ය හා පිරිසිදු ජලය භාවිත කරයි. ඔහු පරිසර හිතකාමී පළිබෝධ පාලන ක්‍රම අනුගමනය කරමින් වගා භූමිය පිරිසිදුව පවත්වා ගනියි. ඔහුට පහසුවෙන් ලබාගත හැකි තත්ත්ව පද්ධති ප්‍රමිතිය වන්නේ,
   (1) අවධි පාලන ලක්ෂ්‍යයක් ඇසුරින් උපද්‍රව විශ්ලේෂණය (HACCP) වේ.
   (2) යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) වේ.
   (3) යහපත් සෞඛ්‍ය ආරක්ෂිත පිළිවෙත් (GHP) වේ.
   (4) යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) වේ.
   (5) ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය (SLS) වේ.

15. පහත දැක්වෙන්නේ බෝග කෙරෙහි ආලෝක තීව්‍රතාව බලපාන ආකාරය දැක්වෙන ප්‍රස්තාරයක් හා ඒ පිළිබඳ දැක්වෙන ප්‍රකාශ කිහිපයකි.




   A - P මගින් වැඩි ආලෝක තීව්‍රතාවය ප්‍රියකරන ශාක නිරූපණය වන අතර, වැඩි ආලෝක තීව්‍රතාවක් ලබා දීමෙන් එම ශාකවල ප්‍රභාසංස්ලේෂණය උපරිම කළ හැකි ය.
   B - මිරිස්, වම්බටු හා වී වැනි බෝග සඳහා ආලෝක තීව්‍රතාව බලපාන ආකාරය Q මගින් නිරූපණය වන අතර, වැඩි ආලෝක තීව්‍රතාවක් ලබා දීමෙන් එම ශාකවල ප්‍රභාසංස්ලේෂණය උපරිම කළ හැකි ය.
   C - R හා S යනු එක් එක් බෝග කාණ්ඩවල ආලෝක සංතෘප්ත ලක්ෂ්‍ය වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,

(1) A පමණි.
(2) B පමණි.
(3) A හා B පමණි.
(4) B හා C පමණි.
(5) A, B හා C යන සියල්ලම ය.

[හතරවැනි පිටුව බලන්න]

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

16. පොහොර ශ්‍රේණිය 5-5-15ක් වන, පොහොර මිශ්‍රණයකින් මෙට්‍රික් ටොන් එකක් සෑදීමට අවශ්‍ය වන යූරියා ප්‍රමාණය වනුයේ,
(1) 110 kg කි.
(2) 210 kg කි.
(3) 230 kg කි.
(4) 420 kg කි.
(5) 460 kg කි.

17. ආහාරයක අඩංගු ඔක්සිහාරක සීනි හා ඇමයිනෝ අම්ල ,තාපය හමුවේ ප්‍රතික්‍රියා කොට දුඹුරු පැහැ සීනි ඇමයිනෝ අම්ල සංකීර්ණය සාදයි.මෙම ක්‍රියාවලිය හඳුන්වන්නේ,
(1) කැරමලීකරණය ලෙසයි.
(2) එන්සයිමීය දුඹුරු පැහැ වීම ලෙසයි.
(3) මෙලාඩ් ප්‍රතික්‍රියාව ලෙසයි.
(4) පැසීමේ ක්‍රියාවලිය ලෙසයි.
(5) ඔක්සිහාරක මුඩු වීම ලෙසයි.

18. පොලිතීන් උමගක ජීව කාලය වැඩි කිරීම සඳහා ගත හැකි වඩාත් සුදුසු ක්‍රියාමාර්ගය වන්නේ,
(1) අධික ආලෝක තීව්‍රතාවට නිරාවරණය නොවන ස්ථානයක ගෘහය ඉදි කිරීම ය.
(2) ගෘහය තුළ වැඩි උෂ්ණත්වයක් හා වැඩි ආර්ද්‍රතාවයක් පවත්වා ගැනීම ය.
(3) ගෘහය තුළ අඩු උෂ්ණත්වයක් හා වැඩි ආර්ද්‍රතාවයක් පවත්වා ගැනීම ය.
(4) ගෘහය පාරජම්බුල කිරණ ප්‍රතිරෝධී පොලිතීන්වලින් ආවරණය කිරීම ය.
(5) ගෘහය පාරජම්බුල කිරණ ප්‍රභාභායනය වන පොලිතීන්වලින් ආවරණය කිරීම ය.

19. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වී වගාව පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.
A - යල කන්නයේ දී වාරි ජලය භාවිත කර වී ඒකක භූමියකින් වී වගා කිරීමෙන් වැඩි අස්වැන්නක් ලබා ගත හැකි ය.
B - යල කන්නයේ දී වර්ෂාව අඩු වීම සහ වලාකුළුවලින් ආවරණය වීම අඩු නිසා වැඩි ආලෝක තීව්‍රතාවක් ලැබේ.
(1) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය ය.
(2) A ප්‍රකාශය සත්‍ය වන අතර B ප්‍රකාශය අසත්‍ය ය.
(3) A ප්‍රකාශය අසත්‍ය වන අතර B ප්‍රකාශය සත්‍ය ය.
(4) A ප්‍රකාශය සත්‍ය වන අතර B මගින් එය තවදුරටත් පැහැදිලි කෙරේ.
(5) B ප්‍රකාශය සත්‍ය වන අතර A මගින් එය තවදුරටත් පැහැදිලි කෙරේ.

20. බීජවල ජීව්‍යතාව කෙරෙහි බලපාන සාධක පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.
A - අධික උෂ්ණත්වය සහිත පරිසරයක බීජ ගබඩා කර තැබීමෙන් බීජවල ජීව්‍යතාවයට හානි සිදු වේ.
B - ගබඩා පරිසරයේ $CO_2$ සාන්ද්‍රණය වැඩි කිරීමෙන් බීජවල ජීව්‍යතාව වැඩි කර ගත හැකි ය.
C - වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාව හා බීජවල ජීව්‍යතාව අතර සම්බන්ධයක් නොමැත.
D - ක්ෂුද්‍ර ජීවීන්ගෙන් පිටවන පරිවෘත්තීය ඵල හේතුකොටගෙන බීජවල ජීව්‍යතාව අඩු වේ.
මෙම ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,
(1) A පමණි.
(2) A හා B පමණි.
(3) B හා D පමණි.
(4) A, B හා C පමණි.
(5) A, B හා D පමණි.

21. කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා බලපාන සාධක කිහිපයක් පහත දැක්වේ.
A - යොදා ගන්නා අමුද්‍රව්‍යවල ප්‍රශස්ත කාබන්:නයිට්‍රජන් අනුපාතය 25-30:1 අතර විය යුතු ය.
B - වල් පැළෑටි බීජ සහ අහිතකර ක්ෂුද්‍ර ජීවීන් විනාශ වී යාම සඳහා කොම්පෝස්ට් ගොඩ තුළ $70^{O}C$ ට වඩා වැඩි උෂ්ණත්වයක් පවත්වා ගත යුතු වේ.
C - pH අගය ආම්ලික තත්වයේ පවත්වා ගත යුතු ය.
මින් සත්‍ය ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ,
(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා B පමණි.
(5) A, B හා C යන සියල්ලම වේ.

[පස්වැනි පිටුව බලන්න]

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

- ප්‍රශ්න අංක 22ට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන භාවිත කරන්න.



22. ඉහත රූපසටහනේ දැක්වෙන්නේ,
(1) මිශ්‍ර බෝග වගාවකි.
(2) සමෝධානිත බෝග වගාවකි.
(3) කෘෂි වන වගාවකි.
(4) සත්ත්ව පාලන ක්‍රමයකි.
(5) බහු ස්තර බෝග වගා ක්‍රමයකි.

23. පාංශු මජ්ජා ජීවියෙකු (meso –fauna) සඳහා උදාහරණයක් වන්නේ,
(1) හංගොල්ලා වේ.
(2) ප්‍රොටොසෝවා වේ.
(3) කොලොම්බෝලා වේ.
(4) දිලීර වේ.
(5) ඇක්ටිනොමයිසිටීස් වේ.

24. භාණ්ඩයක් සඳහා ඇති වෙළඳපොළ ඉල්ලුම $Qd$ =100-2P යන සමීකරණය මගින් නිරූපණය කර ඇත. මෙහි $Qd$ යනු භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය (ඒකක වලින්) වන අතර, $P$ යනු භාණ්ඩයේ ඒකකයක මිල වේ. නිකුත් කරන භාණ්ඩ සැපයුම $Qs$=20+3P මගින් නිරූපණය කර ඇති අතර, $Qs$ යනු වෙළඳපොළට සපයන ලද භාණ්ඩ ප්‍රමාණය (ඒකක වලින්) වේ. වෙළඳපොළ සමතුලිත අවස්ථාවේ දී P සහ Q පිළිවෙලින්,
(1) රු. 10 සහ ඒකක 48 කි.
(2) රු. 12 සහ ඒකක 60 කි.
(3) රු. 16 සහ ඒකක 68 කි.
(4) රු. 58 සහ ඒකක 18 කි.
(5) රු. 68 සහ ඒකක 16 කි.

25. කැරට් හා ගෝවාවල සම නිෂ්පාදන වක්‍ර පහත ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත. මෙම ප්‍රස්තාරය සහ පහත ප්‍රකාශ සලකා බලා පිළිතුරු සපයන්න.




A - මෙමගින් සමාන නිෂ්පාදනයක් ලබා ගැනීමට භාවිත කළ හැකි විවිධ සංයෝජන පෙන්වයි.
B - වක්‍රය මත ඕනෑම ලක්ෂයකින් එකම නිෂ්පාදන ප්‍රමාණයක් ලබා දේ.
C - මූල ලක්ෂයේ සිට ඉවතට යනවිට වක්‍රවලින් නිරූපිත නිෂ්පාදන අගයන් අඩු වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා B පමණි.
(5) B හා C පමණි.

26. යම්කිසි භාණ්ඩයක වෙළෙඳපොළ ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර යන දෙකම සමාන ප්‍රමාණයෙන් දකුණට විතැන් වන විට එහි ප්‍රතිඵලයක් ලෙස,
(1) සමතුලිත මිල වැඩි වන අතර සමතුලිත ප්‍රමාණය අඩු වේ.
(2) සමතුලිත මිල අඩු වන අතර සමතුලිත ප්‍රමාණය අඩු වේ.
(3) සමතුලිත මිල වැඩි වන අතර සමතුලිත ප්‍රමාණය වැඩි වේ.
(4) සමතුලිත මිල නොවෙනස්ව පවතින අතර සමතුලිත ප්‍රමාණය වැඩි වේ.
(5) සමතුලිත මිල නොවෙනස්ව පවතින අතර සමතුලිත ප්‍රමාණය අඩු වේ.

[හයවැනි පිටුව බලන්න]

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

27. $CO_2$ සාන්ද්‍රණය හා ප්‍රභාසංස්ලේෂණ ශීඝ්‍රතාවය අතර සම්බන්ධතාව නිරූපණය වන ප්‍රස්තාරය තෝරන්න.




(1) (2) (3) (4) (5)

28. ආටීසියානු ජල සංචායක පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ආටීසියානු ජලධර යොදා ගනිමින් සාමාන්‍ය ළිං සකසනු ලැබේ.
(2) ආටීසියානු ජලධරවල පුනරාරෝපණ ප්‍රදේශ සෑම තැනකම දැකිය හැකි ය.
(3) ආටීසියානු ජලධර මගින් ඇළ, දොළ, ගංගා හා විල්ලු සඳහා ජලය සපයයි.
(4) ආටීසියානු ජලධරයක් ඉහළින් හා පහළින් පාරගම්‍ය ස්ථරවලින් වට වී පවතියි.
(5) ආටීසියානු ජලධරයකින් පීඩනයකින් යුතු ව ජලය පිටවන විට එය දිය බුබුලක් ලෙස හඳුන්වයි .

29. බීජවල සුප්තතාවය ඉවත් කිරීමේ දී සිදු කරන ප්‍රතිකාර සහ බීජ වර්ග කිහිපයක් පහත දක්වා ඇත.

| | ප්‍රතිකාරය | බීජ වර්ග |
|---|---|---|
| A | බීජාවරණය පිපිරවීම | කරවිල සහ අඹ |
| B | බීජාවරණය පිළිස්සීම | තේක්ක සහ ලූණු මිදෙල්ල |
| C | රසායනික ද්‍රව්‍ය යෙදීම | වී සහ කුරක්කන් |
| D | උණු ජල ප්‍රතිකාර කිරීම | ඉපිල් ඉපිල් සහ ඇකේෂියා |

ඉහත වගුවේ සඳහන් බීජවලට අදාළ නිවැරදි ප්‍රතිකාරය සහිත වරණය වන්නේ,
(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) B සහ C පමණි.
(4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D යන සියල්ලම ය.

30. මාළුවෙකුගේ ඇට සැකිල්ලක ආකාරයට දැක්වෙන ජල වහන පද්ධතිය වන්නේ,
(1) ග්‍රිඩ් අයන් කාණු පද්ධතියයි.
(2) සමාන්තර කාණු පද්ධතියයි.
(3) අහඹු කාණු පද්ධතියයි.
(4) හෙරින්බෝන් කාණු පද්ධතිය යි.
(5) ස්වභාවික කාණු පද්ධතිය යි.

31. රූපයේ දක්වා ඇති A ලෙස නම්කර ඇති මුඛ උපාංග සහිත කෘමි කාණ්ඩය සඳහා උදාහරණ වන්නේ,
(1) පළගැටියන්, කුඹිත්තන් හා වේයන් ය.
(2) පතංගයන්, පැළ මැක්කන් හා වේයන් ය.
(3) පළගැටියන්, වේයන් හා බිබිලි කුරුමිණියන් ය.
(4) පැළ මැක්කන්, පළගැටියන් හා බිබිලි කුරුමිණියන් ය.
(5) වේයන්, කුඩිත්තන් හා පැළ මැක්කන් ය .




32. පලතුරු යුෂ සඳහා ඉහළ බ්‍රික්ස් අගයක් ලැබීම මගින් අදහස් කරන්නේ එම පලතුර,
(1) අඩු පැණි රසක් සහිත පලතුරක් බව ය.
(2) ඉහළ ආම්ලිකතාවයක් සහිත පලතුරක් බව ය.
(3) ඉහළ සීනි ප්‍රමාණයක් සහිත පලතුරක් බව ය.
(4) අඩු තෙතමනයක් සහිත පලතුරක් බව ය.
(5) නොමේරූ පලතුරක් බව ය.



AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

33. රූපයේ දැක්වෙන කෘමියා පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක් වේ.
A - ලෙවකන හෝ තෙත මාත්තු කරන ආකාරයේ මුඛ උපාංග ඇත.
B - දෙවන පියාපත් යුගල තෝලක බවට විකරණය වී ඇත.
C - ජීවන චක්‍රය අසම්පූර්ණ රූපාන්තරණය දක්වයි.
මින් සත්‍ය වන්නේ,



(1) A පමණි.
(2) C පමණි.
(3) A හා B පමණි.
(4) B හා C පමණි.
(5) A, B හා C යන සියල්ලම ය.

34. ශාකවල ඇතිවන විකෘති සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) වර්ණදේහ ව්‍යුහයේ හෝ සංඛ්‍යාවේ සිදු වන තාවකාලික වෙනස්වීමකි.
(2) ස්වාභාවිකව විකෘති ඇති නොවේ.
(3) අධික උෂ්ණත්වය මෙන්ම යාන්ත්‍රික හානි නිසා ඇති වන කම්පන හේතුවෙන් විකෘති ඇති වේ.
(4) විකෘති සෑමවිටම පරපුරෙන් පරපුරට ගමන් කරයි.
(5) ශාක අභිජනනයේ දී විකෘති ඇති කිරීම සඳහා පාරජම්බුල කිරණ භාවිත නොකරයි.

35. ජෛව විද්‍යාත්මක පළිබෝධ කළමනාකරණයේ දී,
(1) ජෛවපාලන කාරකවලට ධාරක විශිෂ්ඨතාවයක් හා සාමාන්‍ය ප්‍රජනන විභවයක් පැවතීම සුදුසු වේ.
(2) නව පළිබෝධ මාදිලි ඇතිවන බැවින් පළිබෝධ පාලනය දිගු කාලීනව පවත්වා ගත නොහැකි වේ.
(3) ව්‍යාධිජනකයින් ශාකවල ප්‍රභාසංස්ලේෂණ කොටස්වලට හානි කිරීමෙන් අස්වනු අඩු කරයි.
(4) සැල්වීනියා මර්ධනයට *Cyrtobagous salviniae* කෘමීන් යොදා ගැනේ.
(5) ජෛව විද්‍යාත්මක පාලනයේ දී යෞවන හෝමෝන භාවිත කිරීම වඩාත් ඵලදායි වේ.

36. එළවලු 'අවම සැකසීම' පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. පහසුවෙන් ආහාරයට ගත හැකි හෝ පිසිය හැකි ලෙස ආහාර සැකසීම සිදු කරයි.
B. ආහාරයේ අඩංගු පෝෂක වර්ග හානි වීම අවම වේ.
C. ආහාරය මත එතිලීන් නිෂ්පාදනය අඩු වේ.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ ,
(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා B පමණි.
(5) A හා C පමණි.

- ශාක රෝග හට ගැනීමට හේතුවන ජෛව සාධක හා ඒ මගින් ඇති කරන රෝග පහත වගුවෙන් දක්වා ඇත.

| | ජෛව සාධකය | රෝගය |
|---|---|---|
| A | වෛරස | දියමලං කැම |
| B | දිලීර | ගොයම් ඔරේන්ජ් පත්‍ර රෝගය |
| C | බැක්ටීරියා | අර්තාපල් හිටු මැරීම |
| D | ෆයිටොප්ලාස්මා | පොල්වල මුල් කුණුවීමේ රෝගය |

37. ජෛව සාධකය හා ශාක රෝග නිවැරදිව ගළපා ඇත්තේ,
(1) A හා B හි ය.
(2) A හා D හි ය.
(3) B හා C හි ය.
(4) B හා D හි ය.
(5) C හා D හි ය.

38. අන්ත උපරිමය නොවන (Non - Climetrics) පලතුරු පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
(1) කැඩූ පසු ඉදීම සිදු වීම ය.
(2) එතිලීන් වායුව වැඩි වශයෙන් නිපදවීම ය.
(3) කැඩූ පලතුරුවල ශ්වසන වේගය ඉහළ යාම ය.
(4) එතිලීන් සැපයීමෙන් පලතුරෙහි එතිලීන් නිෂ්පාදනය වැඩි කළ නොහැකි වීම ය.
(5) එතිලීන් සැපයීමෙන් පලතුරෙහි එතිලීන් නිෂ්පාදනය වැඩි කර ගත හැකි වීම ය.

[අටවැනි පිටුව බලන්න]

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

39. එක්තරා වල්නාශකයක් ක්ෂේත්‍රයට යෙදීමෙන් පසු ප්‍රරෝහණය නොවූ හෝ ප්‍රරෝහණය වෙමින් පවතින බීජ මත ක්‍රියා කර බීජ ප්‍රරෝහණය පමා කිරීම හෝ නතර කිරීම සිදු කරයි. මෙම වල්නාශකය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,
(1) ස්පර්ශ වල් නාශකයක් ලෙස ය.
(2) වරණීය වල් නාශකයක් ලෙස ය.
(3) සංස්ථානික වල් නාශකයක් ලෙස ය.
(4) පූර්ව නිර්ගමන වල්නාශකයක් ලෙස ය.
(5) පශ්චාත් නිර්ගමන වල්නාශකයක් ලෙස ය.

40. නීරෝගී කිරි එළදෙනකගේ සාමාන්‍ය කිරි මුරයක කාල සීමාව,
(1) දින 100 කි.
(2) දින 150 කි.
(3) දින 200 කි.
(4) දින 305 කි.
(5) දින 400 කි.

41. සත්ත්ව අභිජනනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.
A. දෙමුහුම් දිරිය පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වේ.
B. කිට්ටු ඥාති සබඳතාවයක් සහිත සතුන් අතර මුහුම් කිරීම සහාභිජනනය ලෙස හැඳින්වේ.
C. යම් සත්ත්ව වර්ගයක් තුළට වෙනත් වර්ගයකින් හිතකර ජාන ඇතුළු කිරීම දෙමුහුම් අභිජනනයේ දී සිදු වේ.
D. සතුන්ගේ සඵලතාව හා නිෂ්පාදන හැකියාව වැඩිවීම සහාභිජනනය නිසා සිදු වේ.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,
(1) A සහ B පමණි.
(2) B සහ C පමණි.
(3) C සහ D පමණි.
(4) A සහ D පමණි.
(5) A, B සහ C පමණි.

42. එළදෙනකගේ ප්‍රසූතිය ආරම්භ වන්නේ,
(1) ප්‍රොජෙස්ටරෝන් ප්‍රමාණය වැඩි වීම සමඟ ය.
(2) ඊස්ට්‍රජන් ප්‍රමාණය අඩුවීම සමඟ ය.
(3) ප්‍රොජෙස්ටරෝන් ප්‍රමාණය අඩුවීම සමඟ ය.
(4) ප්‍රොලැක්ටින් ප්‍රමාණය වැඩි වීම සමඟ ය.
(5) ඔක්සිටොසීන් ප්‍රමාණය අඩුවීම සමඟ ය.

43. කෘෂිකර්මාන්තයේ දී භාවිත කරන ජල සම්පාදන ක්‍රම කිහිපයක් හා ඒ හා බැඳුණු ලක්ෂණ කිහිපයක් පහත දක්වා ඇත.

| ජල සම්පාදන ක්‍රමය | ලක්ෂණ |
|---|---|
| A. පිටාර ජල සම්පාදනය | P. අර්තාපල්, රටකජු, හා උක් වැනි බෝග සඳහා සුදුසු වේ. |
| B. සවිවර නළ ජල සම්පාදනය | Q. පොහොර හා ජලය සමඟ මිශ්‍ර කර එකවර ලබා දිය හැකි වේ. |
| C. ඇළිවැටි ජල සම්පාදනය | R. අධික සුළං සහිත ප්‍රදේශවලට යොදා ගත නොහැකි වේ. |
| D. බිංදු ජල සම්පාදනය | S. ක්ෂේත්‍රය අවහිර නොවන නිසා යාන්ත්‍රීකරණය පහසු වේ. |
| E. විසිරි ජල සම්පාදනය | T. පහසුවෙන් ජලය ලබා ගත හැකි ප්‍රදේශ සඳහා යොදාගත හැකි වේ . |

එක් එක් ජල සම්පාදන ක්‍රම හා ඊට අදාළ ලක්ෂණ නිවැරදිව ගළපා ඇති වරණය වන්නේ,
(1) AP, BS, CT, DQ හා ER ය.
(2) AR, BP, CQ, DS හා ET ය.
(3) AT, BS, CP, DQ හා ER ය.
(4) AT BP, CR, DQ හා ES ය.
(5) AP, BS, CT, DQ හා ER ය.

44. බිත්තර දමන කිකිළියන් රංචුවක් දිනකට ආහාර කිලෝග්‍රෑම් 200 ක් පරිභෝජනය කරන අතර,ආහාර කිලෝග්‍රෑමයක මිල රු. 200 ක් වේ. එම ගොවිපොළේ දෛනික බිත්තර නිෂ්පාදනය බිත්තර 3,000 ක් වේ. ගොවිපොළ හිමියාට බිත්තරයකට දැරිය යුතු ආහාර පිරිවැය වන්නේ,
(1) රු. 12.50 කි.
(2) රු. 12.80 කි.
(3) රු. 13.00 කි.
(4) රු. 13.30 කි.
(5) රු. 14.00 කි.

[නවවැනි පිටුව බලන්න]

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

45. කෘෂිකාර්මික කටයුතුවලදී වර්ධකයාමක එලදායීව භාවිත කරන අවස්ථා පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| A. | දෙළුම් හා මිදිවල පාතෙනොඵලනය වැඩි කිරීමට | NAA |
| B. | තුවාල වූ පටක රෝගකාරක මඟින් ආරක්ෂා කිරීමට | ABA |
| C. | ශාකවල කුරුභාවය ඉවත් කිරීමට | IBA |
| D. | මල් වර්ගවල නැවුම් බව වැඩිකාලයක් තබා ගැනීමට | සියැටින් |
| E. | රබර් කිරි වැස්සීම උත්තේජනය කිරීමට | NBA |

මින් නිවැරදි ප්‍රකාශ වන්නේ

(1) A, B හා C වේ.
(2) A, B හා D වේ.
(3) A, B හා E වේ.
(4) A, C හා D වේ.
(5) B, D හා E වේ.

46. කිරි එකතු කරන මධ්‍යස්ථානයකට රැගෙන ආ නැවුම් කිරිවලින් නියැදියක් ගෙන එයට ග්ලිසරීන් බිංදු කිහිපයක් දැමූ විට එම කිරි රත් පැහැයට හැරුණි. මෙයින් අනුමාන කළ හැකි වන්නේ කිරිවලට,

(1) ජලය එකතු කර ඇති බවයි.
(2) ලුණු එකතු කර ඇති බවයි.
(3) පාන් පිටි එකතු කර ඇති බවයි.
(4) පොල් කිරි එකතු කර ඇති බවයි.
(5) ෆෝමලීන් එකතු කර ඇති බවයි.

47. බිත්තර රැක්කවීමට කිකිළියක් තෝරා ගැනීමේ දී සැළකිය යුතු කරුණු කිහිපයක් පහත දැක්වේ.

A. නීරෝගී ශක්තිමත් දේහයකින් යුක්ත විය යුතු ය.
B. පිහාටු රාශියකින් යුත් මධ්‍යම ප්‍රමාණයේ දේහයකින් යුක්ත වීම.
C. බාහිර පරපෝෂිතයන් රහිත විය යුතු ය.

මින් නිවැරදි වරණය /වරණ වන්නේ,

(1) A පමණි.
(2) B පමණි.
(3) A හා B පමණි.
(4) A හා C පමණි.
(5) A, B හා C යන සියල්ලමය.

48. කෘෂිකාර්මික කටයුතු සඳහා යථා තත්‍ය කෘෂිකාර්මික පිළිවෙත් භාවිත කිරීමේ දී,

(1) ස්වාභාවික සම්පත් උපරිම පරිභෝජනය මගින් උපරිම නිෂ්පාදනයක් ලබාගනු ලැබේ.
(2) පස, ජලය, පෝෂක හා ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි බෝග වගා කරනු ලැබේ.
(3) කෘත්‍රිම රසායනික ද්‍රව්‍යවලින් තොරව ස්වාභාවික ද්‍රව්‍ය පමණක් භාවිතයෙන් වගා කරනු ලැබේ.
(4) කෘත්‍රිම ද්‍රව්‍ය අවම ලෙස භාවිත කරමින් හා දේශීය සාම්ප්‍රදායික තාක්ෂණය භාවිත කරමින් බෝග වගා කරනු ලැබේ.
(5) තොරතුරු තාක්ෂණය භාවිතයෙන් වගා භූමිවල විචලතාවය නිරීක්ෂණය කරමින් සම්පත් කාර්යක්ෂමව භාවිත කර බෝග වගා කරනු ලැබේ.

49. බිම් සැකසීම පිළිබඳ නිවැරදි වරණය වන්නේ,

(1) අවම බිම් සැකසීමේ දී ප්‍රාථමික බිම් සැකසීම සිදු නොකෙරේ.
(2) ඇටවරා වැනි බහුවාර්ෂික වල් පැළ පාලනය සඳහා ගැඹුරු සී සෑම උචිත ය.
(3) යටි පස බුරුල් කිරීමේ දී මතුපිට පස පෙරළමින් තද ස්තර කැඩීම සිදු කරයි.
(4) ශූන්‍ය බිම් සැකසීමේ දී වල් නාශක භාවිතා කිරීම අවම මට්ටමක පවතී.
(5) කුඹුරු මඩ කිරීමේ දී පාංශු ව්‍යුහය වැඩි දියුණු වේ.

50. භාණ්ඩයකට 'අගය එකතු කිරීමෙන්' අත්වන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ.

A - නිෂ්පාදනයේ ගුණාත්මකබව වැඩි වීම
B - නිෂ්පාදනයට ඉහළ මිලක් ලැබීම
C - අගය දාමයේ නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට පමණක් වාසි අත්වීම

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ ,

(1) A පමණි.
(2) B පමණි.
(3) A හා B පමණි.
(4) A හා C පමණි.
(5) A, B හා C යන සියල්ලම ය.

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers ,
Province Papers , Model Papers ලබා ගත හැක .

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025 සඳහා පෙරහුරු ප්‍රශ්න පත්‍රය

| කෘෂි විද්‍යාව II | 08 | S | II | පැය තුනකි |
|---|---|---|---|---|

**උපදෙස් :**

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 13 කින් සහ ප්‍රශ්න 10 කින් සමන්විත වේ.
- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත වන අතර කොටස් **දෙකටම** නියමිත කාලය පැය තුනකි.

**A කොටස - ව්‍යුහගත රචනා (පිටු අංක 02 - 9)**

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මෙම ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නොවන** බව ද සලකන්න.

**B කොටස - රචනා (පිටු අංක 10)**

- ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A සහ B කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ A කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයේ B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |
| ප්‍රතිශතය | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

සංකේත අංකය

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය | |

Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

## A කොටස -ව්‍යුහගත රචනා

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100 කි.)

1. (A) බෝග වගාව සඳහා වැදගත් වන පාංශු ගුණාංගයක් නිර්ණය කිරීම සඳහා යොදා ගත් පරීක්ෂණ ඇටවුමක රූපසටහනක් පහත දැක්වේ. අංක (i) සහ (iv) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූපසටහන යොදා ගන්න.



(i) රූපයේ දක්වා ඇති පරීක්ෂණ ඇටවුම නම් කරන්න.

.......................................................................................................

(ii) මෙම පරීක්ෂණ ඇටවුම යොදාගෙන නිර්ණය කරනු ලබන පාංශු ගුණාංගය සඳහන් කරන්න.

.......................................................................................................

(iii) එම පාංශු ගුණාංගය නිර්ණය කිරීම සඳහා භාවිත කළ හැකි වෙනත් ක්‍රමයක් සඳහන් කරන්න.

.......................................................................................................

(iv) මෙම පරීක්ෂණය භාවිත කිරීමේ ඇති **අවාසියක්** සඳහන් කරන්න.

.......................................................................................................

(B) ශිෂ්‍යයෙක් උදුනේ වියළා ගත් පස් ග්‍රෑම් 100ක පහත සඳහන් අයන ප්‍රමාණ ඇති බව සොයා ගත්තේ ය.

$H^+ = 6$ meq   $K^+ = 2$ meq   $Mg^{++} = 4$ meq   $Ca^{++} = 12$ meq   $Na^+ = 1$ meq

(i) මෙම පස් නියැදියේ භාෂ්මික අයන ප්‍රමාණය ගණනය කරන්න

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(ii) මෙහි කැටායන හුවමාරු ධාරිතාව ගණනය කරන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(iii) මෙම නියැදියේ භෂ්ම සංතෘප්තතා ප්‍රතිශතය ගණනය කරන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

(C) ජෛව විවිධත්වය පවත්වාගෙන යාම සඳහා ජාන සම්පත් සංරක්ෂණය වැදගත් වේ.

(i) ජාන සම්පතක් ලෙස බීජ භාවිතය වැදගත්වන ආකාර දෙකක් සඳහන් කරන්න.

..................................................................................................................................

..................................................................................................................................

(ii) නෂ්ඨ වීමේ අවදානමක් ඇති ශාක සංරක්ෂණය කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රමයක් සඳහන් කරන්න.

..................................................................................................................................

(D) (i) පහත සඳහන් කාර්යයන් ඉටු කර ගැනීම සඳහා සම්බන්ධ කර ගත යුතු රාජ්‍ය ආයතනය බැගින් නම් කරන්න.

(1) කෘෂිකර්මාන්තයට අදාළ කර්මාන්තයක් ආරම්භ කිරීමේ දී පරිසරයට වන බලපෑම පිළිබඳ ව තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා

..................................................................................................................................

(2) ශ්‍රී ලංකාවට වෙනත් රටකින් දෙමුහුම් බීජ තොගයක් ආනයනය කිරීම සඳහා

..................................................................................................................................

(ii) කෘෂිකර්මාන්තයේ දී නිපදවනු ලබන ඕනෑම ප්‍රධාන නිෂ්පාදන දෙකක් සඳහන් කර, එම එක් එක් ප්‍රධාන නිෂ්පාදන ආශ්‍රිත අතුරු නිෂ්පාදනය බැගින් සඳහන් කරන්න.

| | ප්‍රධාන නිෂ්පාදනය | අතුරු නිෂ්පාදනය |
|---|---|---|
| (1) | .................................................. | .......................................................... |
| (2) | .................................................. | .......................................................... |

(E) (i) කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක දෛනිකව ලබා ගන්නා කාලගුණික පරාමිති හා එම පරාමිතිවලට අදාළ දත්ත කිහිපයක් පහත වගුවේ දක්වා ඇත. එම දත්ත, වගුවේ දැක්වෙන එක් එක් පරාමිතියට අදාළ අගයන් ගැළපෙන හිස්තැන මත සඳහන් කරන්න.

- වර්ෂාපතනය - 25mm
- සූර්ය දීප්ත පැය ගණන - පැය 3
- වාෂ්පීකරණය - 5mm
- පාංශු උෂ්ණත්වය - 29$^{O}$C
- සාපේක්ෂ ආර්ද්‍රතාව - 60%

| | | සටහන් කළ යුතු දිනය | |
|---|---|---|---|
| | | පෙරදින | එදින |
| (1) | වර්ෂාපතනය | .......................... | .......................... |
| (2) | සූර්ය දීප්ත පැය ගණන | .......................... | .......................... |
| (3) | පාංශු උෂ්ණත්වය | .......................... | .......................... |
| (4) | වාෂ්පීකරණය | .......................... | .......................... |
| (5) | සාපේක්ෂ ආර්ද්‍රතාව | .......................... | .......................... |

(ii) පහත සඳහන් දේශගුණික තත්ත්ව නිසා බෝග වගාවට ඇතිවන බලපෑම අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ගය බැගින් සඳහන් කරන්න.

(1) අධික සුළඟ

..................................................................................................................................

(2) අධික ආලෝක තීව්‍රතාව

..................................................................................................................................

AL අපි
Click & Visit Our Site ALapiedu.com
අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය Past Papers , School Papers , Province Papers , Model Papers ලබා ගත හැක .

(F) පුද්ගලයන්ට උපද්‍රවයක් ඇති කිරීමට විභවතාවක් ඇති ඕනෑම දෙයක් ආපදාවක් ලෙස සැලකේ.

(i) අධික උෂ්ණත්වය සහිත එළිමහන් ස්ථානයක දීර්ඝ කාලයක් කෘෂිකාර්මික කටයුතුවල නියැළෙන පුද්ගලයෙකුට ඇතිවිය හැකි අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(ii) කෘෂිකර්මාන්තය ආශ්‍රිතව පුද්ගලයන්ට බහුල ව වැළඳිය හැකි සංක්‍රමණික රෝගයක් සඳහන් කරන්න.

